# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ගාල්ල, මාතර, කළුතර, කොළඹ, කෑගල්ල, රත්නපුර, ගම්පහ, පුත්තලම හා මුලතිව් ප්‍රදේශයන්හි කුඹුරු වල යකඩ විෂ වීම (මලකඩ) බහුලව පවතී. වර්තමානයේදී මෙම තත්ත්වයන් කුරුණෑගල, පොළොන්නරුව වැනි දිස්ත්‍රික්ක වලද වාර්තා වෙමින් පවතී.

කුඹුරු පසේ යකඩ ප්‍රමාණයන් කන්නයෙන් කන්නයට අවුරුද්දෙන් අවුරුද්දට ස්ථානයෙන් ස්ථානයට වෙනස් වෙමින් පවතී. යල කන්නයේදී විශේෂයෙන් ගොයම මෙම යකඩ විෂවීමේ තත්වයට පාත්‍රවීමට වැඩි ප්‍රවණතාවයක් ඇත. මෙයට හේතු වනුයේ කුඹුරු පසේ ස්වභාවිකවම ඇති යකඩ ප්‍රමාණයට අමතරව ගොඩබිමින් දිය සිරාව සමඟද යකඩ පැමිණ තැන්පත්වීමක් සිදු වන නිසාය. එසේම යකඩ විෂවීමේ තත්ත්වය පසේ වයනය හා වර්ෂාපතනය අනුවද විචල්‍යතාවයක් පෙන්වයි. වැලි පසේ යකඩ විෂවීම සුලභව දැකිය හැක. එසේම වර්ෂාපතනය වැඩි කන්නයකදී වුවද මෙම තත්වය උග්‍ර විය හැක.

## යකඩ විෂවීම හඳුනා ගැනීම

ගොයම් ශාකය ඕනෑම අවස්ථාවක යකඩ විෂවීමට පාත්‍ර වියහැක. එහෙත් පඳුරු දමන අවධිය හා ප්‍රජනක අවධිය යකඩ විෂවීමට පාත්‍රවීමේ ප්‍රවනතාවය වැඩිවේ.

- පැලපතේ දී (වර්ධක වර්ධන) අවස්ථාවේදී
  1. වර්ධනය බාලවීම.
  2. පඳුරු දැමීම අඩුවීම.
  3. ශාක කුරුවීම.
  4. පත්‍ර රතු දුඹුරු පැහැයක් ගැනීම
     - ඉතා සියුම් රතු දුඹුරු තිත් වශයෙන් පටන්ගෙන මුලු ශාකය පුරාම පැතිර යයි.
- ප්‍රජනක වර්ධනය අවස්ථාවේදී
  1. ධජ පත්‍රය රතු දුඹුරු පැහැයක් ගැනීම, මෙයද තිත් වශයෙන් ආරම්භ වේ.
  2. කුඩා කරල් ඇතිවීම හා කරලක ඇති ඇට ප්‍රමාණය අඩුවීම.
  3. සම්පූර්ණයෙන් නොපිරිනු ඇට තිබීම.
  4. බීජ දුර්වර්ණ වීම.

## යකඩ විෂවීම බහුලවන කුඹුරු

1. ගොඩබිමෙන් වටවූ වැලි සහිත පටු කුඹුරුයාය.
2. විශාල කුඹුරු යායයන්හි වැලි සහිත කුඹුරු ගොඩබිමට ආසන්නව පවතින වැලි සහිත පටු කුඹුරු තීරුවල මේ තත්වය බහුලව දක්නට ලැබෙනු ඇත.

**සැලකිය යුතුයි :**

පසේ ඇති යකඩ ප්‍රමාණය අනුව යකඩ විෂවීම කිව නොහැක. මෙය පසේ වයනය හා සරු බව සමඟ වෙනස් වේ. වැලි සහිත නිසරු පසක යකඩ 30 ppm ප්‍රමාණය වී ශාකයට විෂවීමට ප්‍රමාණවත් අතර, කාබනික ද්‍රව්‍ය බහුල සරු පසක ඉහත ප්‍රමාණය මෙන් දෙතුන්ගුණයක් තිබුණද විෂවීම පෙන්නුම් නොකරයි.

## යකඩ විෂවන කුඹුරුවලට පිලියම්

### 1. කානු විධිමත් කිරීම

- කුඹුරු යාය වටා ගැඹුරු කානුවක් කැපීම
  - ගොඩබිමෙන් ගලා එන දිය සීරාව කුඹුරට එකතු නොවන සේ කුඹුර වටා, කුඹුරේ මට්ටමට වඩා ගැඹුරු කානුවක් කැපීම හා එහි ජලය යායෙන් පිටතට ගලායාමට පහසු වනසේ ඇල මං සකස් කිරීම
- කුඹුරේ එකතුවන ජලය ගලායාමට හැකි වනසේ යාය තුල ඇති කිවුල් ඇල මං සකස් කිරීම හා නිසි නඩත්තුව

### 2. පසේ සශ්‍රීක බව දියුණු කිරීම

- පොස්පරස් හා පොටෑසියම් ඌණ වූ විට පසෙන් ශාකයට උරා ගන්නා යකඩ ප්‍රමාණය වැඩිය. එබැවින් නිසි ලෙස පොස්පරස් හා පොටෑසියම් පසට සැපයිය යුතුය. කුඹුරට පොහොර යෙදීමේදී මූලික පොහොරක් ලෙස යොදන පොස්පරස් සපයන ට්‍රිපල් සුපර් පොස්ජේට් නිර්දේශිත ප්‍රමාණයන් අනිවාර්යයෙන් ම යෙදීම වැදගත්ය. එසේම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ඒ ඒ ප්‍රදේශයට නිර්දේශිත පොහොර ප්‍රමාණයන්ට අමතරව යකඩ විෂවන කුඹුරකට මියුරියේට් ඔෆ් පොටෑෂ් අක්කරයකට කි. ග්‍රෑ. 15 ක් වැඩිපුර ලැබෙන සේ යෙදීම කළ යුතුයි. තවද රසායනික පොහොරට අමතරව,
  - පිදුරු යෙදීම. (අක්කරයට ටොන් 1 - 2)
  - අඟුරු කරනු ලැබූ දහයියා යෙදීම (අක්කරයට කි.ග්‍රෑම් 250) ද විශේෂයෙන් ශාකයට අවශ්‍ය පොටෑසියම් හා අනෙකුත් අංශු මාත්‍ර මූල ද්‍රව්‍යයන් ලබාදේ. මෙම පෝෂ්‍ය පදාර්ථයන් ප්‍රමාණවත් මට්ටමේ ඇති විට වී ශාකයට යකඩ උරා ගැනීම අඩුවේ.
  - ග්ලිරිසීඩියා වැනි කොල අතු තනි තට්ටුවකට ලියද්ද වැසෙන ප්‍රමාණයට දැමීම ද ඉතා වැදගත්ය.
  - වියලි ගොම පොහොර. (අක්කරයට ටොන් 1 - 2 ක්) වැනි ද්‍රව්‍ය එක්කර පසේ කාබනික තත්ත්වය දියුණු කිරීම මඟින් ද යකඩ විෂවීමේ තත්ත්වය අඩු කරයි

### 3. පසේ ආම්ලික තත්ත්වය අඩු කිරීම

- ආම්ලික පසකදී (4 - 5.5pH) ශාකය විසින් යකඩ වැඩිපුර උරා ගැනීම නිසා යකඩ විෂවීමේ තත්ත්වයක් පෙන්නුම් කරයි. මෙය මඟ හරවා ගැනීමට පසේ ආම්ලිකතාවය වී ශාකයට සුදුසු වන ලෙස පහත මට්ටමකට (6 - 7pH) රැගෙන ආයුතුය. ඒ සඳහා ඩොලමයිට් කුඩු ඒකාකාරීව පසට මිශ්‍ර කලයුතු වන අතර අක්කර එකක් සඳහා ඩොලමයිට් 800kg කන්න හතරකට වරක් යෙදීම ප්‍රමාණවත්ය.

### 4. පස වියලීම

- වගා කන්නය තුළදී පස වරින් වර වියලි තත්ත්වයට පත් කිරීම

### 5. ප්‍රතිරෝධී ප්‍රභේද භාවිතය

- වඩාත් කාර්යක්ෂම ඵලදායිම ක්‍රමය වනුයේ මලකඩට (යකඩ විෂවීමට) ඔරොත්තු දෙන වී ප්‍රභේද භාවිතයයි.

1. බී.ඩබ්. 267 - 3
   - මාස 3 1/2 වයස් කාණ්ඩයේ සුදු දිගැටි සහල් සහිත වර්ගයකි. මධ්‍යස්ථ අස්වනු විභවයක් ඇත. අක්කරයකට බුසල් 80 - 100 ක් පමණ දක්වා ලබාගත හැක. මධ්‍යස්ථ උසක් ඇති මෙම වී ප්‍රභේදය ඇද වැටීමට පාත්‍ර විය හැකිය. තෙත් කලාපයට නිර්දේශිතයි.



2. බී.ඩබ්. 361
   - මාස 3 1/2 වයස් කාණ්ඩයේ මධ්‍යස්ථ දිගැටි රතු සහලින් යුත් වැඩි අස්වනු වී වර්ගයකි. අක්කරයකට වී බුසල් 120 - 220ක් දක්වා ලබා ගත හැකිය. තවද මිටි වී ප්‍රභේදයක් වන මෙය ඇද නොවැටේ. වියලි සහ අතර මැදි කලාපවලට නිර්දේශිතයි.

3. බී.ඩබ්. 363
   - මාස 3 1/2 වයස ඇති මධ්‍යස්ථ දිගැටි සුදු සහල් සහිත වන අතර, වැඩි අස්වනු විභවයක් ඇත. අක්කරයකට බුසල් 120 - 220 ක් දක්වා ලබා ගත හැකිය. මිටි වර්ගයක් බැවින් ඇද නොවැටේ. දිවයිනේ ඕනෑම කලාපයකට නිර්දේශිතයි.

4. බී.ඩබ්. 364
   - මාස 3 1/2 වයස ඇති දිගැටි රතු සහල් සහිත වන අතර, තෙත් කලාපයේ වැලි සහිත යකඩ විෂ වන කුඹුරු සඳහා නිර්දේශ කර ඇත. මධ්‍යස්ථ උසක් තිබුනද ඇද නොවැටේ. අක්කරයකට බුසල් 100 - 120 ක් පමණ දක්වා අස්වැන්නක් ලබා ගත හැක.


ආචාර්ය අමිතා පී. බෙන්තොට, *පර්යේෂණ නිළධාරිනී,*
බී.ජී.ඩී.එස්. වීරසිංහ, *පර්යේෂණ නිළධාරී,*
ආචාර්ය ඩබ්.එම්.ජේ. බණ්ඩාර, *පර්යේෂණ නිළධාරී*

*ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, බෝඹුවල*
*වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බතලගොඩ*



Designed by: AUDIO VISUAL CENTRE, Department of Agriculture, Peradeniya. Printed by: AGRICULTURE PRESS, Gannoruwa.


# මලකඩ කුඹුරුවලට පිළියම්

## (යකඩ විෂවීම)



කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.